Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

සතිය - සැප්. 04

ශ්‍රේණිය - 10

1) නිපුණතාවය - 1. පරිසර නිරීක්ෂණයෙන් ලැබෙන අත්දැකීම් ඇසුරුකර ගනිමින් නර්තන නිර්මාණය කරයි.

2) නිපුණතා මට්ටම - 1.3 භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරයි.

3) පාඩම හෝ ඒකකය - 1:3:1 විස්මය නැමැති ස්ථායී භාවය නිරූපණය කරමු.

4) ඉගෙනුම් ඵල -

❖ විස්මය නැමැති ස්ථායී භාවය නිසා උපදින රසය නම් කරයි.
❖ විස්මය නැමැති භාවය නිරූපණය කර දක්වයි.
❖ එම භාවය දැක්වීමට අදාළ සිදුවීම් ගොඩ නගයි.
❖ එම රංගන අවස්ථාවල නියැලීමට හැකි වේ.

5) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

❖ මෙහි ඇතුළත් කියවීම් පත්‍රිකාව අවබෝධයෙන් කියවයි.
❖ රස හා භාවයන්ට අදාළ තොරතුරු රැස් කිරීම.
❖ භාව නිරූපණය කරමින් කැඩපතක් ඉදිරියට ලොස් පුහුණු වීම.
❖ ''අඬවන් වූ දෙනෙතින් ගලනා'' ගීතය ශ්‍රවණය කිරීම. එම ගීතයට පහළ වන හැඟීම් මෙනෙහි කිරීම.

6) උපයෝගී කර ගත හැකි පොත් පත්, website, ඉගෙනුම් ආධාරක

❖ e- තක්සලාව - https://www.e-thaksalawe.mo.go.lk
❖ e- නැණ පියස - Course : 10 වසර නර්තන කලාව

7) කියවීම් පත්‍රිකාව -

භාවයක් මුල් කරගනිමින් රසයක් උපදී. මෙය අවස්ථාවෙන් අවස්ථාවට වෙනස් වේ. භාවයක් මුල වීම තුළින් රසයක් උපදී. ශම හෙවත් භක්ති නම්භාවය නිසා ශාන්ත නම් රසය උපදී. ශම

භාවයෙහිදී මුහුණෙහි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ ලෙස ඇස් අඩවන් වීම, එක ඉරියව්වක පිහිටීම, සන්සුන් වීම, සංයමය ඇති වීම ආදිය දැක්විය හැක.

**උදා -** ආගමික ස්ථානයකට ආවේශ වූ මොහොතක ඉහත ක්‍රියාකාරකම් දැක ගත හැකිය.

8) කාර්ය පත්‍රිකාව

1. විස්මය නැමැති සුථායී භාවයෙන් උපදින රසය නම් කරන්න.
2. විස්මය නමැති ස්ථායි භාවය නිරූපණය කළ හැකි කෙටි සිද්ධියක් නිර්මාණය කරන්න.
3. ඒ සිද්ධිය නර්තනය මුසු කරමින් ඉදිරිපත් කිරීමට යොදා ගත හැකි අංග චලන පිළිබඳ අධ්‍යයනය කරන්න.
4. එම සිද්ධිය විස්මය නැමැති ස්ථායි භාවය නිරූපනය වන අයුරින් රංගනය කරන්න.
5. කැඩපතක් ඉදිරියට ගොස් මුහුණෙන් භාවයන් ඉදිරිපත් කරමින් ස්වයං අධ්‍යයනයක යෙදෙන්න.

| |
|---|
| උදා - <u>සිද්ධියක් ගොඩ නැගීම</u> කැලයක් මැදින් යන තරුණියකට මලින් බර ගසක් දකී. ඇය සතුටින් මල් නෙලාගෙන එන විට ගල් තලාව මත මීදුමක් අතරින් අමුතු දෙයක් දකී. ඇය පුදුමයට පත්වේ. දේවතාවියක් ඇය පුදුමයට පත් කරමින් අහසට නැගුනාය. |

9) අතිරේක පොත් පත්

- ❖ 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන ආයතනය
- ❖ 10 ශ්‍රේණිය නර්තන කලාව - ඥානසිරි පීරිස් මහතා.